**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතිය - 2020**

---

**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රවාහන ව්‍යාපෘතිය සූදානම් කිරීමේ පහසුකම් පිළිබඳ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ද ඇතුළුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස් ආර් අයි (එස් එෆ්) දරන ණය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.03(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

**ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන්නේ ප්‍රවාහන අමාත්‍යාංශය වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ප්‍රමුඛ ප්‍රවාහන ව්‍යාපෘතියේ සූදානම වැඩි දියුණු කිරීමයි. කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කිරීම සඳහා උපදේශන සේවා සැපයීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් එක් අංගයක් යටතේ ක්‍රියාත්මක වේ.**

**ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො.මිලියන 11.36 හෙවත් රු.මිලියන 1,853 කට සමාන වටිනාකමක් වන අතර මෙම ඇස්තමේන්තුගත පිරිවැයෙන් ඇ.ඩො. මිලියන 9.69 හෙවත් රු.මිලියන 1,406.05 ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි ශේෂය වූ රු. මිලියන 448 කට සමාන වූ මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කර ඇත. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.**

**1.3 මතය**

---

**මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී.

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමණාකරනය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** භෞතික කාර්ය සාධනය

---------------------------

**2.1** ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

-----------------------------------------------

| සංරචකය | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ඒකක/ ප්‍රතිශතය | ලබා ඇති කාර්ය සාධනය ඒකක/ ප්‍රතිශතය | | |
| උපදේශන සේවා වාර්තාව<br><br>-ශක්‍යතා අධ්‍යයන අවසන් වාර්තාව<br><br>-කොළඹ සිට රඹුක්කන, කොළඹ සිට කළුතර, රාගම සිට මීගමුව සඳහා කෙටුම්පත් අවසන් වාර්තාව සහ ලංසු ලේඛන. | 100 | 80 | කාර්ය සාධනයේ ප්‍රමාදයන් | • අදාළ රැස්වීම් සඳහා IESL නියෝජිතයෙකු නොමැතිවීම සහ IESL සාමාජිකයින්ගේ මෙම සංවර්ධනය සම්බන්ධයෙන් විරෝධතා සහ උපදේශකයින් විසින් ඔහුගේ පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට ගතවන සැලකිය යුතු කාලසීමාව හේතුවෙන් IESL විසින් මතු කරන ලද ගැටළු කිහිපයක්.<br><br>• එමෙන්ම COVID-19 වසංගත කාලසීමාව හේතුවෙන් අනිවාර්ය විදේශ විශේෂඥයින් ලබා ගැනීමට, ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමට ද හැකියාවක් නොමැත. |

| | |
|---|---|
| කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | කිසිදු මූල්‍ය පිරිවැයකින් තොරව 2021 ජනවාරි සිට 2021 අප්‍රේල් දක්වා කාලය දීර්ඝ කිරීම සඳහා MOT සහ ADB වෙත දැනුම් දීමට PMU හට සිදු වූ එවැනි ප්‍රමාදය කුමක්ද,මෙම සියලු ගැටලුවලින් පසුව දීර්ඝ කළ කාලසීමාව තුළ මෙම උපදේශනය යටතේ එන රේඛා හතර සම්බන්ධයෙන් සියලු වාර්තා එකතු කර ගැනීමට හැකිය. |
| විගණකගේ නිර්දේශය | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කළ යුතුයි. |

**2.2** කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යුරෝ 256,030 ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 6.48 ක් සහ රුපියල් මිලියන 379.21 ට සමාන ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව කැලණිවැලි දුම්රිය මාර්ගය සැලසුම් කිරීම සඳහා උපදේශන පහසුකම් සැපයීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. කෙසේ වෙතත්, සමාලෝචිත මුදල් වර්ෂය තුළ ඉදිරිපත් කළ යුතු උපදේශක වාර්තා 10 න්, KV රේඛාව සඳහා අවසන් ශක්‍යතා වාර්තාව, කෙටුම්පත් අවසන් වාර්තාව සහ කොළඹ සිට රඹුක්කන සඳහා ලංසු ලේඛන, කෙටුම්පත් අවසන් වාර්තාව, කොළඹ සිට කළුතර දක්වා ලංසු ලේඛන සහ කෙටුම්පත් අවසන් වාර්තාව සහ රාගම සිට මීගමුව සඳහා ලංසු ලේඛන වාර්තා 2020 දෙසැම්බර් 31 දින දක්වා අවසන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 දෙසැම්බර් 31 දිනට උපදේශන ගිවිසුමට අනුව අපේක්ෂිත ප්‍රතිඵලය ලබාගෙන නොතිබුණි. | 2017 දෙසැම්බර් 13 දින ගිවිසුම් අත්සන් කරන ලද පරිදි, වසර අවසානය වන විට ප්‍රතිදාන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ව්‍යාපෘතියට අවශ්‍ය වාර්තා උපදේශකයා විසින් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කැලණිවැලි දුම්රිය මාර්ගය දෙපස අනවසර පදිංචිකරුවන් 2,036 දෙනෙකු වසර තුනක කාලයක් තුළ නැවත පදිංචි කිරීම සඳහා 2018-2020 කාලය තුළ වාර්ෂික අයවැය මඟින් රුපියල් මිලියන 9,600 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. කෙසේ වෙතත්, ඔවුන් සඳහා 2020 දෙසැම්බර් 31 වන විට ලබා දී ඇත්තේ නිවාස ඒකක ගණන 386 ක් පමණි. ඒ අනුව අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉදිකිරීම් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු සඳහා අරමුදල් සැපයීම සඳහා දුම්රිය මාර්ග නැවත පදිංචි කිරීම මූලික අවශ්‍යතාවයක් විය. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ඉදිකිරීම් කඩිනම් කළ යුතුයි. |

## 2.3 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය ව්‍යාපෘති අරමුණුයටතට නොගැනුණද, ආසන වෙන්කිරීමේ පද්ධතිය සඳහා රු.මිලියන **4.83** ක මුදලක් සහ නැවත පදිංචි කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා රු.මිලියන **77.14** ක මුදලක් ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණු අතර එම වියදම් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘති වියදම් ලෙස දක්වා ඇත. | **REIP** යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත දුම්රිය ස්මාර්ට් ටිකට්පත් සහ ආසන වෙන් කිරීමේ පද්ධතිය සඳහා සැලසුම් සහ ලංසු ලේඛන සකස් කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම සඳහා රු.මිලියන **4.92**ක් වැය කර ඇත. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල විෂයපථය සමාලෝචනය කර ඒ අනුව චක්‍රලේඛ උපදෙස් අදාළ කර ගැනීම අවශ්‍ය වේ. |

## 2.4 පද්ධතිය සහ පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වසර **5** ක කාලය සඳහා ඇස්තමේන්තුගත මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන **0.50** කි.කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින්ඇමෙරිකානු ඩොලර් **665,351**ක් වැය කර ඇති අතර එය එම කාලය සඳහා ඇස්තමේන්තුගත මුදල ඇමෙරිකානු ඩොලර් **165,351** කින් ඉක්මවා ගොස් ඇති අතර එය වසර දෙක තුළ රු.**30,822,782** ට සමාන වේ. | එය **REIP** ව්‍යාපෘතිය යටතේ පසුගාමී මූල්‍ය පහසුකම අනුමත කර ඇත, එබැවින් **PMU** පිරිවැය පුරෝකථනය කළ ඩොලර් **0.5** ඉක්මවන බව අප හඳුනාගත් විට එය ඉක්මවන **PMU** පිරිවැය වහාම නතර කරන ලදී. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි දක්වා ඇති අයවැය ප්‍රතිපාදනවලට අනුකූලව වියදම් කළ යුතුය. |